


# කණ්ඩායම් සංගීතයේ එදා අද සහ මෙල්බර්න් නුවර "තරංගා"




මල්බර හිමිදිරියේ - කොයිබද සමනළියේ
යන්නේ හිරු එළියේ - කියන්න සියුමැලියේ

මෙම ගීතය ජීවිතයේ වරක් හෝ ශ්‍රවණය නොකලෙකු සිංහල ගීත ශ්‍රාවකයින් අතර ඇතැයි සිතීම දුෂ්කරය. එහෙත් එම ගීතය බිහිකළෝ කවරහුද ? එම ගීතය බිහිවුණේ කුමන පසුබිමකද? එම ගීතය සමග උපත ලද සංගීත ප්‍රවනතාව කුමක්ද යන වග දන්නෝ විරල වෙතැයි සිතමි.

ශ්‍රී ලාංකික කණ්ඩායම් සංගීතය ඇසුරේ උපත ලද ප්‍රථම සිංහල ස්වතන්ත්‍ර ගීතය වන්නේ "මල්බර හිමිදිරියේ" ගීතය බව විචාරක මතයයි. ඉංග්‍රීසි ගීත ගයන වෘත්තීය මට්මමේ සංගීත කණ්ඩායම් 60 දශකය වන විට ඉංග්‍රීසි උගත් සමාජයෙහි සිය ගායන වාදන ඉදිරිපත් කරමින් සිටියද සිංහල ගී ගයන වෘත්තීය මට්ටමේ සංගීත ශිල්පීන් උපත ලබන්නේ ලොස් කැබෙලෙරෝස් (LOS CABELLEROS) හා ලා සිලොනියන්ස් (LA CEYLONIANS) යන සංගීත කණ්ඩායම් දෙක මූලිකව බව පෙනේ. ලොස් කැබලෙරෝස් සංගීත කණ්ඩායම ඇසුරේ නිර්මාණය වූ උක්ත ගීතය එහි නායක නෙවිල් ප්‍රනාන්දුගේ තනු නිර්මාණයක් වූ අතර එය ඔහුට තනු රචකයකු ලෙස එවක ඉහල ප්‍රසිද්ධියක් අත් කර දෙන්නට සමත්විය. සුනිල් ආර් ගමගේ රචනා කරන ලද සුජාතා අත්තනායක ගයන "මංගල කසී සළු" නැමැති ගීතයද එයින් පසු නෙවිල් අතින් තනු නිර්මාණය වූ ජනප්‍රිය ගීතයකි.

මල්බර හිමිදිරියේ ගීතයෙන් පසු ඔවුන් "සඳක් නැගී සඳක් ගිලේ සාගරේ" "මැනිකේ ඔබේ සිනාවේ" වැනි ජනප්‍රිය ගීත ගණනාවක් නිර්මාණය කළේය. ඔවුන් ලද ජනප්‍රියත්වය කොතෙක්ද යත් 1966 වසරේ ලෙස්ටර් ජේම්ස් පීරිස් අධ්‍යක්ෂණය කළ "දෙළොවක් අතර" චිත්‍රපටයට ගීතයක් ගයමින් පෙනී සිටීමටද ඇරයුම් ලැබුණි. එම ගීතය විශාරද අමරදේව - මහගමසේකර හා ලොස් කැලෙබරොස් නායක නෙවිල් ප්‍රනාන්දු යන ත්‍රි පුද්ගල සුසංයෝගයේ පලයක් වූ "ගයන ගැයුම් නටන නැටුම් - ඉවත හෙලයි ශෝක සුසුම්" නැමැති ගීතයයි. මෙම සංගීත කණ්ඩායමට රුක්මනී දේවී සම්බන්ධ වීමෙන් පසු තවත් ජනප්‍රිය ගීත ගණනාවක් නිර්මාණය වූ අතර "පුන්සඳ හිනැහෙන්නේ නාමල් පිබිදෙන්නේ" යන ගීතය ඉහළ ජනප්‍රියත්වයක් ලද එක් ගීතයකි.

60 දශකය අගභාගය වන විට තවත් සංගීත කණ්ඩායම් රාශියක් කරළියට පැමිණි අතර "සමනලයෝ" (Samanalayo) ධර්මරත්න බ්‍රදර්ස් (DHARMARATHNA BROTHERS) ලොස් මුසාචෝස් (LOS MUCHACHOS) ඒ අතර ප්‍රකටව පැවතුනි. එම සංගීත කණ්ඩායම් අතර කැපී පෙනෙන ප්‍රධාන ලක්‍ෂණය වූයේ කණ්ඩායම් අනන්‍යතාවයට සරිලන ස්වතන්ත්‍ර නිර්මාණ බිහිකිරීමට දැක්වූ උනන්දුවයි. එමෙන්ම ඔවුන් තෝරාගත් සංගීත භාණ්ඩ මතු නොව ඇඳුම් පැළඳුම් පවා ඔවුන්ගේ කණ්ඩායම් ලකුණ විදහා දැක්වීය. එහෙත් ඔවුන් අතර වූ මහ පොදු සාධකය වූයේ බටහිර සංගීත ධාරාවට අනුගත වීමයි.

කුමන සංගීත ක්‍රමයකට අනුගත වුවද ඔවුන් අතින් බිහිවූ කණ්ඩායම් ගීත නිර්මාණ ශ්‍රාවක මතකයේ තැන්පත් විය. අදත් ඉඳහිට ඇදෙන එම ගීත අපට සිහිපත් කරන්නේ සජීවී බන්ඩායම් සංගීතයක අතීත මතකයයි.

- ❖ ලොස් කැබෙලෙරෝස් -

  මල්බර හිමිදිරියේ
  මැණිකේ ඔබේ සිනාවේ
  සඳක් නැගී සඳක් දිලේ සාගරේ
  පුන්සඳ හිනැහෙන්නේ

- ❖ ලා සිලොනියන්ස් -

  හොයියා හොයියා
  තරුණ ජීවිතේ අපේ විනෝදයෙන්
  දහදුක් විඳලා දරුවන් හදලා

- ❖ මුන්ස්ටෝන්ස් -

  මංගෝ කලු නැන්දේ
  රුවන් පුරය අපේ ගම තමයි-
  මැණිකේ සුදු මැණිකේ
  වන දෙව්ලිය තුරුලේ

- ❖ සමනලියෝ -

  නැලවෙන මව් උකුලේ

- ❖ මී මැස්සෝ -

  මුලු ගතම වෙහෙසුණා

- ❖ ත්‍රී සිස්ටර්ස් -

  ඉඳුනිල් මිණි කැට
  මිහිරි ගීත ගයාලා

- ❖ සුපර් ගෝල්ඩන් චයිම්ස් -

  මුතු මැණිකේ උදේ රැයින්

- ❖ ජිප්සීස් -

  තොරන් බඳින්නට
  කුරුමිට්ටෝ
  ලුණු දෙහි
  ඕයේ ඔජායේ
  සිකද්කෙදෝරේ

ඉහත දැක්වූ සියලුම සංගීත කණ්ඩායම් 60 - 70 දශක තුළ සිය නිර්මාණ චාරිකාව ආරම්භ කළ අතර එවකට ඔවුන් ගැයූ ගී ඉහළ ජනප්‍රියත්වයක් අත්කර ගත්තාය.

80 දශකයෙන් මෙපිට සංගීත කණ්ඩායම් පිළිබඳ සිහිපත් කරන විට ඒවා සිංහල කණ්ඩායම් සංගීතයේ මුල් යුගයේ නිර්මාණ ඉක්මවා යන නිර්මාණාත්මක සාර්ථකත්වයක් ළඟා කර ගත් බවක් නොපෙනේ.

එහෙත් වාණිජ අතින් සාර්ථකත්වයට පත් වූ සංගීත කණ්ඩායම් ගණනාවක් බිහිවිය. ඒවා බොහොමයක් මුදල් ඉපැයීමේ දිශාවට විතැන් වූ අතර ශ්‍රාවක රසවින්දනය පිළිබඳ උනන්දුවක් ඔවුන් තුළ තිබූ බවක් නොපෙනේ. එබැවින් ඔවුන් තුළින් සාර්ථක කණ්ඩායම් සංගීත නිර්මාණ රස විඳීමේ අවස්ථාව ශ්‍රාවකයන්ට අහිමි විය. මෑත භාගයේ "මේරියන්ස්" සංගීත කණ්ඩායමේ නලින් ගයන "අංජලීකා" ගීතය හැරුණු විට කණ්ඩායම් සංගීත ශිල්පීන් මතකයට නගාගත හැකි වැඩි යමක් ශ්‍රාවකයනට ඉතිරිකොට නැත. සංගීත කණ්ඩායමක් ලෙස කැපී පෙනෙන ආරම්භයක් සනිටුහන් කළ "සිහ ශක්ති" වැනි සංගීත කණ්ඩායමක් පවා කැඩී විසිරී යාම මෑත කාලයේ කණ්ඩායම් සංගීතයක මතු බලාපොරොත්තු අප වෙතින් දුරස් කළේය. ප්‍රසිද්ධ ශිල්පීන් ගයන වේදිකාවට පසුබිම් සංගීතය සැපයීමත් මංගල උත්සව සඳහා සංගීත ලබාදීමෙනුත් හැරුණු කොට අද දවසේ ශ්‍රී ලාංකික සංගීත කණ්ඩායම් තුළින් සිදුවන වෙනත් නිර්මාණාත්මක කාර්යයක් නොපෙනේ. ඒ වෙනුවට ඔවුන් ප්‍රසස්ත නිර්මාණ සඳහා කරනු ලබන හානිය සුළුපටු නොවේ. වෙළඳ පොළට සංගීත කණ්ඩායම් එමින් නිකුත් කොට ඇති අවිරාම ගී (NON STOP) කැසට් පට දෙස බැලීමේදී මේ බව හඳුනාගත හැකිය. "ප්‍රොමිසස් අංක 1", සිංදු කාමරේ, බයිලා වෙනස, සංගීත වෙනස, නොනවතින ගී ආදී විවිධ නම් වලින් දැකගත හැකි කැසට් පට ඊට උදාහරණ සපයයි. මෙමගින් තහවුරු කරනු ලබන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් නූතන කණ්ඩායම් සංගීතය පිළිබඳ දක්වා ඇති මතයයි. ඔහුට අනුව අද දවසේ සංගීත කණ්ඩායම් බහුලව දකින්නට ලැබෙතත් "කණ්ඩායම් සංගීතය"නම් මුළුමනින්ම අහෝසි වී තිබේ.


කණ්ඩායම් සංගීතය පිළිබඳ උක්ත කරුණු විදර්ශන මත සටහන් කරන්නට ආසන්නම නිමිත්ත වූයේ 'තරංගා' සංගීත ප්‍රසංග යයි. "තරංගා" මෙල්බර්න් නුවර විසි වසක ගමන් මග සැමරීමේ ප්‍රසංගයේ රසිකයෙකු වන්නට මම ද අවකාශ ලදිමි. සැබැවින්ම එය මෙල්බර්න් නුවර ශිල්පීන් පමණක් සංගීතය සැපයූ මෙතෙක් මා දුටු සාර්ථකම ප්‍රසංගය බව කිව යුතුය. කුඩා ශ්‍රී ලාංකික රසික සමාජයක් වෙසෙන මෙල්බර්න් නුවරට ඔවුන් වෘත්තීය මට්ටමේ නාදරටා කැඳවාගෙන ආවේය. එහි පැවති ශිල්පීය කැපවීමත්, වගකීමත් එම නාද රටා අතර මම අත්වින්දෙමි. එමෙන්ම තරුණ කැලක් හා අත්වැල් බැඳගනිමින් "අනාගත තරංගා සංගීතයක හැඩරුව" බිහිකරන්නට කැමරන් කොළඹගේ තුළ පවතින ඕනෑකම අපගේ සොම්නසට හේතුවෙයි. "තරංගා" හුදු පසුබිම් සංගීතය සැපයීමෙන් පමණක් තෘප්තිමත් වී සිටිය යුතුයයි මම නොසිතමි. සංගීත කණ්ඩායකම් ලෙස නිර්මාණ බිහිකළ හැකි මනා සංකලනයක් එම ශිල්පීන් සතුව පවතින වටපිටාවක ඊට අවතීර්ණ නොවී සිටීම එම කුසලතා අපතේ යැවීමකැයි මට සිතේ. අද සංගීත කණ්ඩායම් අතින් ගිලිහී ඇත්තේද එම මහඟු කාර්යයි. "තරංගා" වැනි කුසලතා පූර්ණ ශිල්පීන් පිරිසක් සපිරි කණ්ඩායමකට එවැනි ඉදිරි පියවරකට අවතීර්න වන්නට කාලය පැමිණ තිබේ. මන්ද ඊට අවැසි මූලික කුසලතා ඔවුන් සපුරා ඇති බැවිනි.

සංගීත කණ්ඩායමක මෙහෙවර තක්සේරු වන්නේ එහි වයස මතම නොවන බව අමුතුවෙන් කිව යුතු නැත. එබැවින් අපේ සැළකිල්ලට බඳුන් විය යුත්තේ එහි වයස නොව ඔවුන් එක්ව ඉටු කොට ඇති කාර්ය භාරයයි. එම කාර්යභාරය සැළකිය යුතු මට්ටමක නැත්තේ නම් වයස යනු නිෂ්ඵල කාලයක මතකයක් මිස අන් යමක් නොවේ. එබැවින් තරංගා අභිමුව ඇත්තේ පලදායී වර්තමානයක් හා අනාගතයක් බිහිකර ගැනීමේ අභියෝගය බව මගේ හැඟීමයි. එම අභියෝගය ජයගනු ඇති තරමට ඔවුන් ගෙවන කාලයද අර්ථවත් වනු නොඅනුමානය.

*එබැවින් නිර්මාණ බිහිකිරීමේ ශක්‍යතා සපිරි "තරංගා" තුළින් කණ්ඩායම් සංගීතයට ඉතිරිවන මිහිරක් පිරි නිර්මාණයක් බිහිවනු ඇතැයි යන සුබවාදී අපේක්‍ෂාව විදර්ශන මත ලියා තබමි.*

**රවී සිරිවර්ධන**
ravi.siriwardhana@gmail.com

## මායා බන්ධන



ඇසට පෙනේ
උකුළත් - ළැමත්
සිතට පෙනේ
පුංචි පුංචි
හැදෙන - බිඳෙන
බිඳෙන - හැදෙන
රූප ගොඩක
එක් වීමක්
වෙන් වීමක්

**සාමන්ත තැන්නගේ**